www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# පකිස්ථානය මත දැඩි බලපෑම් යෙදෙන ඇෆ්ගනිස්ථානයේ එක්සත් ජනපද-නේටෝ අර්බුදය

## US/NATO crisis in Afghanistan generates greater pressure on Pakistan

**ජේම්ස් කෝගන් විසිනි**
**2008 ජුනි 26**

එක්සත් ජනපදයේ පිටුබලය ලබන ජනාධිපති කර්සායිගේ ආන්ඩුව හා නේටෝ හමුදාවන්ට, කන්දහාර් නගරයට කිලෝමීටර් 16ක් වයඹ දෙසින් පිහිටි සිය ගනනක් ආක්‍රමනික විරෝධී සටන්කරුවන් විසින් සිය පාලනයට නතුකරගෙන ඇති ආගන්ඩැබ් නිම්නයේ ගම්මාන යලි අත්කර ගැනීම පිනිස මූලික මෙහෙයුමක් දියත් කිරීමට බලකෙරී ඇත. ජුනි 13 වන දින කන්දහාර්හි සාපෝසා බන්ධනාගාරයට පහරදුන් අවස්ථාවේ නිදහස ලැබූ දහසකට වැඩි සිරකරුවන්ද මෙයට සම්බන්ධවුනා විය හැකිය. ඔවුන් මෑතකදී පකිස්ථානයේ ආරක්ෂිත ස්ථානවල සිට ඇෆ්ගනිස්ථානයට ඇතුල්වූ ත්‍රස්තවාදීන් සමඟ සම්බන්ධ වූ බවට වාර්තා විය.

දහයකට වැඩි ගම්මාන සංඛ්‍යාවක් යලි අත්කර ගැනීමේ ප්‍රහාරය මෙහෙයවමින් ප්‍රාදේශික හමුදා ශක්තිමත් කිරීම සඳහා කාබුල්හි සිට ආගන්ඩැබ් වෙත 700 දෙනෙකුගෙන් සමන්විත ඇෆ්ගන් හමුදා සේනාංකයක් පිටත්කර හැරීය. ජනතාවට නිවාසවලට වී සිටින ලෙස දැනුම් දෙමින් නේටෝ ගුවන් යානාවලින් පත්‍රිකා හෙලනු ලැබිනි. කෙසේවුවද, වසර ගනනාවක් තිස්සේ ජනතාවට මරනය හා තුවාල සිදුකල එක්සත් ජනපද ගුවන් හා කාලතුවක්කු ප්‍රහාරවලින් පසුව ජනතාව තීන්දුකලේ පලායාමටයි. ආන්ඩුවේ පාලනයෙහි ඇති ආගන්ඩැබ් නදියේ නැගෙනහිර පිහිටි මුර කපොල්ලක සේවයේ යෙදී සිටි පොලිස් භටයෙකු රොයිටර් වෙත කියා සිටියේ ගම්වැසියන් 4000 ක් පමන ප්‍රදේශය අතහැර කන්දහාර් වෙත පලාගිය බවය.

කැනේඩියානු හා එක්සත් ජනපද මිලිටරි ගුවන් යානා, ඔත්තු ගුවන් යානා හා ප්‍රහාරක හෙලිකොප්ටර්වල පිටුබලය සහිතව පසුගිය සතියේ බදාදා ඇෆ්ගන් හමුදා ගංගාව තරනය කර නිම්නයට ඇතුලු විය.

හානි පිලිබඳව එකිනෙකට පටහැනි වාර්තා පලවේ. එක්සත් ජනපද ගුවන් යානයකින් හෙලන ලද කිලෝ 225 ක බෝම්බයකින් හැරුනු වලක් වටා දමා තිබුනු සුන්වී ගිය පිරිමි මලසිරුරු 19 ක් සහිත මනාරා ගම්මානය වෙත කන්දහාර් ආන්ඩුකාර අබ්දුල්ලා කාලිඩ් විසින් මාධ්‍යකරුවන් කැඳවාගෙන ගියේය. මෙහෙයුමේදී අඩුම තරමින් ගරිල්ලා භටයන් 105 ක් වත් මියගිය බව කාලිඩ් ප්‍රකාශ කලේය.

ඇමරිකානු හා කැනේඩියානු නිලධාරීන් කාලිඩ්ගේ ප්‍රකාශ අනුමත නොකරමින් කියා සිටියේ විවිධාංගවලින් හොඳින් සන්නද්ධව සිටින ටාඩිලෑමේ හමුදාවන් සමඟ ඍජු ගැටුමක් මඟහරිමින් ත්‍රස්තවාදීන් ප්‍රදේශයෙන් පලාගොස් ඇති බවයි. මෙහෙයුමේ මුල් පැය ගනන ඇතුලත ඇෆ්ගන් භටයන් දෙදෙනෙකු මිය ගියේය. වෙනත් ටාඩිලෑමේ හමුදා මරන වාර්තා නොවීය.

සති අන්තයේදී නේටෝ නිලධාරීන් කියාසිටියේ ආගන්ඩැබ් නිම්නය තම පාලනයේ සුරක්ෂිතව ඇති බවය. එසේ වුවත් ත්‍රස්තවාදීන්ට ප්‍රධාන සිර කඳවුරකට නොබියව කඩාවැදීමටත් ඇෆ්ගනිස්ථානයේ විශාලතම නගරයක් ආසන්නයේ ගම්බද ප්‍රදේශයක් අල්ලා ගැනීමටත් හැකිවීමෙන් පෙනීයන්නේ එක්සත් ජනපදය මෙහෙයවන ටාඩිලෑමේ අස්ථාවරත්වයයි.

නේටෝවේ ජාත්‍යන්තර ආරක්ෂක බලකායේ (අයිඑස්ඒඑෆ්) අනදෙන නිලධාරියාව සිටි එක්සත් ජනපද ජෙනරාල් ඩැන් මැක්නීල් ජුනි මස මුලදී මාධ්‍යකරුවන් වෙත කියාසිටියේ ඇෆ්ගනිස්ථානය වැනි විශාල හා ජනාකීර්න රටක් පාලනය කිරීමට අඩුම ගනනේ භාරලක්ෂයක හමුදාවක් අවශ්‍ය බවයි.

කෙසේවෙතත් අයිඑස්ඒඑෆ් සතුව ඇත්තේ 53,000 ක හමුදාවක් පමනි. ඉනුදු 20.000 ක් සමන්විත වන්නේ ත්‍රස්තවාදී ක්‍රියා බහුලව සිදුවන දකුනු පලාත්වල පස්තුන් වාර්ගික ජනකොටස්වලිනි. අයිඑස්ඒඑෆ් වෙතින් ස්වාධීනව නැගෙනහිර ප්‍රදේශවල ක්‍රියාත්මක වන 14,000 ක ඇමරිකානු හමුදාව ප්‍රකාශිත පරිදි ඔසාමා බින් ලාඩන් හා ඉතිරිව සිටින අල් කයිඩාවරු සෙවීමේ නිරතව සිටියි. ඇෆ්ගන් හමුදාවේ සහාය විදේශ හමුදාවන්ට ලැබුනත් එය සමන්විත 70,000 ක භට සංඛ්‍යාව පුහුනුව අතින් මෙන්ම විශ්වාසනීයත්වයෙන් ද විෂම ය.

ප්‍රධාන නගරවලින් බැහැරදී ත්‍රස්තවාදීන්ට සැලකිය යුතු නිදහසක් ඇතිව ක්‍රියාකල හැකිව තිබේ. ටාඩිලෑමේ හමුදාවන් මුහුනපා සිටින මිලිටරි අභියෝගයන්ට අමතරව ඇෆ්ගනිස්ථාන- පකිස්ථාන දේශසීමාව දෙපස පස්තුන් වරු අතර ඇති ගෝත්‍රික සබඳකම් ද සැලකීමට සිදුව තිබේ. පස්තුන්

සටන්කරුවන් පකිස්ථානයේ ස්වාධීන ගෝත්‍රික පලාත් යොදාගනිමින් දෙරට අතර නිදහසේ ගමන්කරන අතර විවේක ගැනීමටත් සැපයුම්, බඳවාගැනීම් හා පුහුනුව සඳහාත් ඒවා යොදාගනියි. වොෂින්ටනයේ බලපෑම් යටතේ පකිස්ථානු ආන්ඩුව 2002 වසරේ පටන් දස දහස් ගනන් හමුදාව දේශසීමා ප්‍රදේශ තුල ස්ථානගතකර ඇත. කෙසේවුව ද, වසර ගනනාවක් පස්තුන් ගෝත්‍රිකයන් සමඟ ඇතිවූ ගැටුම්වලින් පසුව දේශසීමා හරහා කටයුතු වැලැක්වීමේලා පකිස්ථානු හමුදා අසමත්වී හෝ බොහෝ අවස්ථාවල මෙන් තවදුරටත් ඊට අකැමැත්තක් දක්වයි.

නැගෙනහිර ඇෆ්ගනිස්ථානයේ ඇමරිකානු හමුදා අනදෙන නිලධාරී එක්සත් ජනපද මේජර් ජෙනරාල් ජෙෆ්රි සෙක්ලොසර් මාධ්‍යවලට ප්‍රකාශ කලේ සිය හමුදාවනට එල්ල වන ප්‍රහාර මේ වසරේදී සියයට 40 කින් වැඩිවී ඇති බවය. ත්‍රස්තවාදී ප්‍රහාරවලින් සියයට 12 ක්ම එල්ල වන්නේ පකිස්ථානු දේශසීමාව දිගේ බව ද ඔහු පැවසීය. "සතුරාට දේශසීමා ප්‍රදේශවල දී රැකවරනය හා ක්‍රියාකිරීමට යම් නිදහසක් ලැබී තිබේ" යයි ද ඔහු පැවසීය.

මං මාවත්වල බෝම්බ ඇටවීමේදී ඇෆ්ගන් ගරිල්ලන් දැන් උපායශීලී නිපුනත්වයක් ලබා ඇතැයි ද සෙක්ලොසර් පැවසීය. ජෙනරාල් වාර්තා කලේ මෑත මාසවල ත්‍රස්තවාදීන්, රථ පෙලකට එක් බෝම්බයක් පසුකර යාමට ඉඩදී ඉදිරියේදී දෙවන බෝම්බය පුපුරවා හරින බවයි. බෝම්බ පිපිරවීමෙන් පසුව මඟ දෙපසින්ම මැෂින් තුවක්කු හා සුලු අවි ප්‍රහාර එල්ල කරයි. එක්සත් ජනපද මිලිටරිය විසින් පාවිච්චි කරන වඩාත් සන්නද්ධ කල වාහන විනාශ කිරීමේ අරමුනෙන් ත්‍රස්තවාදීන් පුපුරන ද්‍රව්‍ය ප්‍රමානය ද වැඩිකර තිබේ යයි ඔහු පැවසීය.

වාහන හා ශරීර ආවරන ඇෆ්ගනිස්ථාන වාඩිලෑමේ හමුදාවන් අතර මරන හා තුවාල සංඛ්‍යාව සාපේක්ෂව පහල මට්ටමක පැවතීමේ ප්‍රධාන සාධකයයි. කෙසේවුවද, මෙම මාසයේ හානි වැඩිවී තිබේ. ජූනි මාසය තුල මේ වනවිට අඩුම තරමින් එක්සත් ජනපද හා නේටෝ හමුදාවේ 35ක් මියගොස් ඇත. මාර්තු 19ක් ද අප්‍රේල් 14 ක්ද මැයි මාසයේ 23 ක්ද මියගොස් ඇත.

ජූනි 24 වන දින කාබුල්හි නේටෝ හමුදාවන්ට ආහාර ගෙන ගිය ට්‍රක් රථ පෙලක් සයිඩබාඩ් නගරයට ලඟාවෙමින් තිබියදී යතුරුපැදිවල නැගි ගරිල්ලන්ගේ ප්‍රහාරයකට ලක්විය. ගරිල්ලන් එක් අයෙක් මරාදමා ට්‍රක් රථ 40 කට ගිනි තැබූහ. හෙල්මන්ඩ් ප්‍රදේශයේ සැන්ගින් නිම්නයේ සටනකදී එදින ම එක් බ්‍රිතාන්‍ය සෙබලෙක් වෙඩි වැදී මියගිය අතර නැගෙනහිර නන්ගාර් ප්‍රදේශයේදී මුර සංචාරයකදී බිම් බෝම්බයකට හසුවීමෙන් එක් ඇමරිකානු සෙබලෙක් මිය ගොස් තවත් තිදෙනෙක් තුවාල ලැබීය.

එම සිද්ධියට පෙර දින එක්සත් ජනපද ගුවන් ප්‍රහාරයකින් නන්ගාර්හිදී තරුනයෙක් හා ලමයෙක් මිය ගියේය. එය ස්වදේශික ගෝත්‍රික ජනතාව අතර උද්ඝෝෂන ඇවිලවීය. පකිස්ථානයේ සිට පැමිනි ත්‍රස්තවාදීන් විශාල සංඛ්‍යාවක් හා එක්සත් ජනපද හමුදාවන් අතර සති අන්තයේදී ගැටුම් හටගත්තේය. ඇමරිකානු මිලිටරි ආරංචි මාර්ග සඳහන් කලේ ප්‍රධාන කොටම ගුවන් ප්‍රහාරවලින් සටන් කරුවන් 55 දෙනෙක් මියගිය බවයි.

## පකිස්ථානය මත යෙදෙන තෙරපුම

ත්‍රස්තවාදය වැඩෙද්දී, නේටෝ රටවල් එක්සත් ජනපදයේ ඉල්ලීම්වලට දිගටම හරස් කපති. කැනඩාව හා බ්‍රිතාන්‍ය වෙතින් අෆ්ගනිස්ථානයට තව තවත් හමුදා යවන ලෙස ඉල්ලුම් කෙරේ. මෙම සතියේදී ජර්මනිය තමන් 1000 ක අතිරේක හමුදා යවන බව නිවේදනය කලේය. එහෙත් ඒ, ඔක්තෝබරයෙන් පසුව හා සාපේක්ෂව සංසුන්ව ඇති රටේ උතුරු කලාපයේ සේවාවන් සඳහා පමනක් බවත් වාර්තා වෙයි.

මිලිටරි නායකයන් කියන ආකාරයට අවශ්‍ය අතිරේක ප්‍රහාරක භට කන්ඩායම් යොදවාගන්නේ කෙසේද යන්න පිලිබඳව නේටෝව තුල පවත්නා අර්බුදය මධ්‍යයේම, සටන්කරුවන් ආරක්ෂාව පතා පකිස්ථානු භූමි භාගයන් යොදාගැනීම නතර කිරීම සඳහා තවත් පියවර ගන්නා ලෙස එරට නව ආන්ඩුවට කෙරෙන බලපෑම් ද වැඩිවෙයි. එහි ප්‍රතිපලයක් වශයෙන් පකිස්ථානය තුල අස්ථාවර තත්වයක් වර්ධනය වෙයි.

ඇෆ්ගන් සටන්කාමීන් ලොව පුරාම ලේබල් ගසා ඇත්තේ "තලිබාන්" හෝ 2001 වසරේදී පෙරලා දමනු ලැබූ ඉස්ලාම් මූලධර්මවාදී තන්ත්‍රයේ හිතවාදීන් ලෙසය. එවන් ලේබලයකින් කෙරෙන්නේ එක්සත් ජනපදය ප්‍රමුඛ ආක්‍රමනිකයාට එරෙහිව පෙලගැසී ඇති දේශපාලන හා මිලිටරි විරෝධයේ පරිමාව වසංකිරීම පමනි.

එක්සත් ජනපද වාඩිලෑමට එරෙහි සටන්කාමීත්වයේ, විජිත විරෝධී මනෝගතිය ප්‍රමුඛ ක්‍රියාකලාපයක් ඉටුකරන ගාමක බලවේගයන් ගනනාවකි. සියවසකට වැඩි කාලයක් පුරා පකිස්ථාන-ඇෆ්ගනිස්ථාන දේශසීමාවේ දෙපසම වාසය කරන පස්තුන් ගෝත්‍රික ජනතාව සිය භූමි භාගයන් යටත්කර ගැනීමේ සියලු උත්සාහයන්ට එරෙහිව දිග් ගැස්සුනු ගරිල්ලා යුද්ධවල නියැලී සිටිති. එක්සත් ජනපද හා නේටෝ හමුදාවන්ට මෙන්ම ගෝත්‍රික ප්‍රදේශවල යොදවා ඇති පකිස්ථාන ආන්ඩුවේ හමුදාවන්ට ද එල්ල වී ඇති විරෝධය සරලව ම ඔවුන්ගේ නිදහස සඳහා ගෙන යන දිගු අරගලයක නවතම පරිච්ඡේදයයි.

කාබුල්හි කර්සායිගේ පාලන තන්ත්‍රය වෛරයට ලක්ව ඇත්තේ එය ඇමරිකානු රූකඩයක් වන නිසා

පමනක් නොවේ. වාර්ගික, ගෝත්‍රික හා ආගමික කාරනා ද ඊට බලපා තිබේ. කර්සායි පස්තුන් ගෝත්‍රයට අයත් වුව ද, පස්තුන් ගෝත්‍රයේ ඉහල පැලැන්තිය ඔහුගේ ආන්ඩුව දැක ගන්නේ, 1990 ගනන්වල ඔවුන් සටන් වැදුනු තජික් හා උස්බෙක් යුද දෙටුවන්ගේ හෙන්චයියෙක් ලෙසය.

1992 දී සෝවියට් රූකඩ ආන්ඩුව බිඳ වැටීමෙන් පසුව බලයට පත් බෙහෙවින්ම අස්ථාවර යුද දෙටු තන්ත්‍රය අවසන් කිරීමට පකිස්ථානයේ පිටුබලය ලත් පස්තුන් ව්‍යාපාරය ලෙස තලේබාන්වරු ඉස්මතු විය. පකිස්ථානය තුල අවාසනාවන්ත ඇෆ්ගන් සරනාගත කඳවුරුවලින් මෙන්ම පකිස්තානු ගෝත්‍රික ජනතාව අතරින් ද හමුදාවක් සඳහා තරුනයන් බඳවාගැනීම සඳහා සුන්නි ඉස්ලාම් අන්තවාදය හා පස්තුන් ජාතිකවාදය ගසාකන ලදී. පකිස්ථානු මිලිටරිය, විශේෂයෙන්ම අයිඑස්අයි බුද්ධි ආයතනය විසින් තලිබාන්වරුනට මුදල් හා ආයුධ සපයන ලදී. 1994 දී තලිබාන්වරු දකුනු ඇෆ්ගනිස්ථානයට ඇතුල්වන විට බොහෝ පස්තුන් ගෝත්‍ර ඔවුන් සමඟ පෙල ගැසුනහ. 1996 දී ඔවුහු කාබුල් අල්ලා ගත්හ.

වර්තමාන ත්‍රස්තවාදය 1994-96 සිවිල් යුද්ධයට බොහෝ සමානකම් දක්වයි. තලිබාන්වරුන් විසින් පරාජය කල යුද දෙටුවන් උතුරු සන්ධානය ලෙසින් පැලපදියම් විය. 2001 දී බුෂ් පරිපාලනය ඔවුන් යලි බලයේ පිහිටුවිය. දැන් තලිබාන් හා උතුරු සන්ධානය පස්තුන් ආධිපත්‍ය පිහිටුවීමට සටන් වදිති.

1990 ගනන්වල පකිස්ථානය තලිබාන් වරුනට පිටුබලය දීමේදී අභිප්‍රේරනය වූයේ ආගමික, ගෝත්‍රික හෝ වාර්ගික කරුනු මත නොව පකිස්ථානු පාලක පන්තියේ භූ දේශපාලනික අවශ්‍යතාවන් ගෙනි. ඔවුන්ගේ ප්‍රමුඛ උත්සුකය වූයේ, රුසියාව හා ඉරානය ද සමඟ සිය කලාපීය පසමිතුරා වන ඉන්දියාවේ බලපෑම යටතට තජික් හා උස්බෙක් යුද දෙටුවන් ඇදවැටේය යන්නය.

පකිස්ථානය තුල එක්සත් ජනපද මිලිටරිවාදය කෙරේ ඉහ වහා ගිය මහජන විරෝධයක් පැවතිය ද, පර්වේස් මුෂාරෆ්ගේ ආඥාදායකත්වය සිය සහකාර තලේබාන් රාජ්‍ය විනාශකිරීමට එකඟ වූයේ වොෂින්ටනය සමඟ තම සන්ධානය සුරක්ෂිත කරගැනීමේ අපේක්ෂාවෙනි. එය පකිස්ථානය තුල තලේබාන් වැඩ කටයුතු තලාදැමීම සඳහා වොෂින්ටනයෙන් එල්ලවූ බලපෑමට ද හිස නැමූ අතර ස්වාධීන ගෝත්‍රික ප්‍රදේශ තුලට 90,000 ක හමුදාවක් ද පිටත් කලේය. කෙසේවුවද, සත්වසරක පමන කාලයක් ගතවන විට, ඇෆගනිස්ථානයේ වැඩෙන ඉන්දියානු බලපෑම ද, පකිස්ථානයේ දේශසීමා ප්‍රදේශවල දැඩි මිලිටරි පියවර ගැනීමට එක්සත් ජනපදය කරන නිරන්තර බලපෑම් ද හමුවේ එක්සත් ජනපදය හා පකිස්ථානය අතර විරසකයක් මතුවෙමින් තිබේ.

එක්සත් ජනපදයේ රැන්ඩ් සමාගමේ විශ්ලේෂකයෙකු වන සෙත් ජෝන්ස් ජූනි 13 වන දින ඇමරිකානු හඬ ගුවන් විදුලියට මෙසේ පැවසීයඃ " කාබුල් ආන්ඩුව පකිස්ථානය සමඟ නොව ඉන්දියාව සමඟ දැඩි ලෙස සන්ධානගතව සිටින ආකරය ඔබට දැන් දැකගත හැකිය. මා සිතන්නේ මෙය ප්‍රධාන උත්සුකයක් වන බවයි. ඇෆ්ගනිස්ථානයේ පදනම්වූ ඉන්දියානු ව්‍යාපෘතීන් ගනනාවක් ඔබට දැකගත හැකිය. මාර්ග ඉදිකිරීම් ඒ අතර වෙයි. ඉන්දියානු මුදල් විශාල වශයෙන් ගලා එයි. මා සිතන්නේ මෙය පකිස්ථානු ආන්ඩුවේ ජ්‍යෙෂ්ඨයන් අතර මෙන්ම නිසැකව ම ආන්ඩුවේ ප්‍රධාන ආතනවල පහල මට්ටම්වල ද අවධානයට ලක්ව ඇති බවයි."

පකිස්ථානය ඇතුලතින් ඇෆ්ගන් ත්‍රස්තවාදීන්ට පිටුබලය ලැබෙන බව ජෝන්ස් පවසයි. "එක්සත් ජාතීන් ද ඇතුලත් සංවිධාන ගනනාවකින් නේටෝව පැහැදිලි තොරතුරු සපයාගෙන තිබේ. පකිස්ථාන් භූමිය තුල ක්‍රියාත්මක වීම පිලිබඳ නිෂ්ක්‍රීය සහයෝගයකට වැඩි දෙයක් පවතින බව ඉන් ඇඟවුම් කෙරෙයි. පුහුනු කටයුතු, මෙහෙයුම් ආධාර, තොරතුරු සැපයීම වැනි ආධාර පකිස්ථාන ආන්ඩුවේ විශේෂයෙන්ම බුද්ධි අංශයේ හා දේශසීමා බලඇනි මඟින් සිදුවේ."

පකිස්ථාන් මිලිටරියට එරෙහිව එක්සත් ජනපදය එල්ල කරන දෝෂාරෝපන රැල්ලක් තිබේ. පසුගිය ඉරිදා බ්‍රිතාන්‍ය *ඔබ්සර්වර්* පත්‍රය වාර්තා කලේ ගෝත්‍රික ප්‍රදේශයන්හි ආරක්ෂාව පිලිබඳ වගකීම දරන පැරා මිලිටරි හමුදාව වන පකිස්ථානයේ දේශසීමා බලඇනිවල සාමාජිකයන් දේශසීමාව හරහා ප්‍රහාර එල්ල කිරීමට සහභාගී වන බවට ඇමරිකානු මිලිටරිය සතුව සාක්ෂි "ගොඩක්ම" ඇති බවය. නම හෙලි නොකල මූලාශ්‍රයක් *ඔබ්සර්වර්* පත්‍රයට මෙසේ පවසා ඇත. "යථාර්තය නම්, සහාගය කරගෙන යන කටයුතුවලට විරුද්ධ කන්ඩායම් අනෙක් පාර්ශවය සමඟ බෙහෙවින් හිතවත් වීමය. අවස්ථාව පැමිනි විට ඔවුන් ඇෆ්ගන් හා සහාග හමුදා වෙත වෙඩි තබනු ඇත. මෙය හුදෙකලාව සිදුවන දෙයක් නොවේ. එය ඉතා මැනවින් සම්බන්ධීකරනය විය හැකිය."

ජූනි 11 වන දින, පකිස්ථානයේ මෝමාන්ඩ් ගෝත්‍රික ප්‍රදේශවල දේශසීමා සේනාංක වෙත එල්ල කල එක්සත් ජනපද ගුවන් ප්‍රහාරවලින් සෙබලු 11 දෙනෙක් මිය ගියහ. ඇමරිකානු මිලිටරිය දිගටම අවධාරනය කලේ තමන් බෝම්බ දැමුවේ ඇෆ්ගන් හමුදාව වෙත ප්‍රහාර එල්ල කොට දේශසීමාවෙන් එහාට පැනයන තලේබාන් ත්‍රස්තවාදීන් වෙත බවට ය.

ජූනි 24 වන දින නිව්යෝර්ක් ටයිම්ස් පත්‍රය ප්‍රකාශ ගනනාවක් පලකලේය. පකිස්ථානු "මිලිටරිය තලිබාන්වරු සමඟ සටන් විරාමයක් හා සිරකරුවන් හුවමාරුවක් සූදානම් කරයි. එමගින් සටන්කරුවන් දේශසීමා ප්‍රදේශ දිගේ තම අඩුපඩු දිගුකර ගන්නා අතර ඔවුනගේ අභය භූමි තහවුරු කර ගැනීමට ඉඩ සලසයි."

ජූනි 15 වන දින ඇෆ්ගන් ජනාධිපති හමීඩ් කර්සායි ප්‍රකාශ කලේ සිය හමුදාවට දේශසීමාව තරනය කර තලේබාන් ත්‍රස්තවාදීන් හඹා යාමට අයිතියක් ඇති බවයි. ඇෆ්ගන් ත්‍රස්තවාදය කෙරෙහි පකිස්ථානයේ සෘජු නිහැඬියාව පිලිබඳ දෝෂාරෝපන, ආතතීන් උත්සන්න කරනවා පමනි. අවසානයේදී එය, එක්සත් ජනපදය හා ඉන්දියාව ද ඇතුලත් අනෙකුත් බලයන්ද පකිස්ථානය සමඟ විවෘත ගැටුමකට ඇද දමන ඇෆ්ගනිස්ථාන- පකිස්ථාන දේශසීමා යුද්ධයක් අවුලුවා ලිය හැකිය.

© www.wsws.org